# KEY FACT DOCUMENT

## ව්‍යාපාරික බැංකු සේවා

## MURABAHA මූල්‍ය පහසුකම

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | Murabaha යනු ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි, බැංකුව විසින් තෙවන පාර්ශ්වීය සැපයුම්කරුවෙකුගෙන්/ විකුණුම්කරුවෙකුගෙන් වත්කමක් මිලදී ගෙන එය එකවර ගෙවීමේ හෝ ක්‍රමානුකූලව ගෙවීමේ පදනමක් මත එකඟ වූ මිලකට (පිරිවැය සහ ලාභය ඇතුළත්) ගනුදෙනුකරුට නැවත විකිණීමේ ගිවිසුමකි. |
| Murabaha වර්ග | 1. Local Murabaha – Murabaha ගනුදෙනුවක් කිසියම් ගනුදෙනුකරුවෙකු සමග දේශීයව, කෙටිකාලීන පදනමක් මත සිදුකරන්නේ නම් Local Murabaha ක්‍රමය භාවිතා කළ හැක.<br><br>2. Extended Murabaha – Murabaha ගනුදෙනුවක් වසරකට වැඩි කාලයක් සඳහා සිදුකරන්නේ නම් Extended Murabaha භාවිතා කළ හැක. Extended Murabaha සඳහා කාලීන ණයවර ලිපි කාලය මඟින් බලපෑමක් ඇති නොවේ.<br><br>3. Import Murabaha - අපනයන සම්බන්ධ ඕනෑම ගනුදෙනුවක් Import Murabaha හරහා සිදු කළ හැක.<br><br>4. Musawamah - ගනුදෙනුවක පිරිවැය හඳුනාගත නොහැකි නම් සහ විකුණුම් මිල පමණක් අනාවරණය කර ඇත්නම්, දේශීයව හෝ ජාත්‍යන්තරව Musawamah භාවිතා කළ හැක. |
| සේවාවෙහි ස්වභාවය | **Murabaha ක්‍රමය පහත සඳහන් දේවල් වෙනුවෙන් කෙටි/මධ්‍ය/දීර්ඝකාලීන මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා භාවිතා කරනු ලැබේ:**<br>අමුද්‍රව්‍ය, භාණ්ඩ තොග, උපකරණ, වත්කම් මූල්‍ය පහසුකම්, රථවාහන මූල්‍ය පහසුකම් (Extended Murabaha), හෝ මිලදී ගැනීමට බලාපොරොත්තු වන වෙනත් වත්කම් |

| | |
|---|---|
| | • පාරිභෝගිකයාට අලෙවි කළ යුතු භාණ්ඩය ස්පර්ශ කළ හැකි ආකාරයෙන් තිබිය යුතු හෝ එහි පැවැත්ම සහතික කළ හැකි විය යුතු අතර, භාණ්ඩයේ හිමිකාරීත්වය විකුණුම්කරු සතු විය යුතුය.<br><br>• බැංකුව, ගනුදෙනුකරු සහ විකුණුම්කරු භාණ්ඩයේ මිල සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය වශයෙන් එකඟ විය යුතුය.<br><br>• Murabaha ගිවිසුම තුළ විකිණීමේදී එක් පාර්ශ්වයකට පක්ෂග්‍රාහී වන සහ සාමාන්‍ය වෙළඳපොළ පිළිවෙත්වලට අනුකූල නොවන කිසිදු කොන්දේසියක් ඇතුළත් නොවිය යුතුය.<br><br>• නම්‍යශීලී ආපසු ගෙවීමේ සැලසුම් (කෙටි කාලීන / දීර්ඝකාලීන)<br><br>• කල් පසු වූ ගෙවීම් මත පදනම් වූ Murabaha විකුණුම් (Bai Muajjal) වලදී පහත සඳහන් කරුණු ෂරියා මූලධර්මවලට අනුකූල වන බවට සහතික කරගත යුතුය.<br><br>– බැංකුව විසින් ගනුදෙනුකරුට ගෙවීම් දිනය නිශ්චිතව සඳහන් කළ යුතුය.<br>– ස්ථිර කාලසීමාව ආරම්භ වන්නේ භාණ්ඩය භාර දුන් මොහොතේ සිටය.<br>– කලින් හෝ ප්‍රමාද වී සිදුකරන ගෙවීම් සඳහා ස්ථාවර මිල වෙනස් කළ නොහැක.<br>– ආපසු ගෙවීම සහතික කිරීම සඳහා ඇපයක් ඉල්ලා සිටීමට බැංකුවට අවසර ඇත. |
| අවශ්‍ය ලිපිලේඛන | • Murabaha මූල්‍ය පහසුකම් සඳහා අයදුම්පත්‍රය<br>• ප්‍රෝෆෝමා ඉන්වොයිසිය<br>• ප්‍රධාන Murabaha ගිවිසුම<br>• නියෝජිත ගිවිසුම<br>• Murabaha ගනුදෙනු ලේඛනය (එකඟ වූ මිලකට අමානා බැංකුව වෙතින් භාණ්ඩය/වත්කම නැවත මිලදී ගැනීමට බැඳී සිටින බව)<br>• මිල ගණන් සහ ඒවා පිළිගැනීමේ ලිපිය<br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ: |

| | |
|---|---|
| | https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |

## TIJARAH මූල්‍ය පහසුකම

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | Tijarah යනු ණය පදනම මත නිමි භාණ්ඩ අලෙවි කරන ගනුදෙනුකරුවන් සඳහා වන, විකුණුම් සහ නියෝජිතායතන පදනම් කරගත් මූල්‍ය පහසුකමකි. මෙම පහසුකම මඟින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ නිමි භාණ්ඩ තොග විකිණීමට, ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමට සහ අත්පිට මුදලට භාණ්ඩ විකිණීමේ ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකි වේ. මෙම සංකල්පය යටතේ බැංකුව ගනුදෙනුකරුවන්ගේ නිමි භාණ්ඩ මිලදී ගන්නා අතර, පොදුවේ ණය පදනම මත වෙළඳපොළේ එම භාණ්ඩ විකිණීම සඳහා පාරිභෝගිකයා එහි නියෝජිතයා ලෙස පත් කරයි. |
| Tijarah වර්ග | 1. දේශීය වෙළඳාම් සඳහා Tijarah මූල්‍ය පහසුකම්<br>2. අපනයන සඳහා Tijarah මූල්‍ය පහසුකම් |
| සේවාවෙහි ස්වභාවය | • නිමි භාණ්ඩ ගිවිසුමක් ණය පදනම මත හෝ මුදල් පදනම මත ඇතිකර ගැනීමට අවසර ඇති අතර එම භාණ්ඩ දිගු කාලයක් පාරිභෝගිකයාගේ තොග එකතුවේ තබාගත හැක.<br>• ටිජාරා ගිවිසුමෙහි මිල ගිවිසුම අවසානයේ දැනගත යුතුය. එම මිල මුදල් හෝ ස්පර්ශ්‍ය භාණ්ඩ ආකාරයෙන් හෝ යම් කාල සීමාවක් සඳහා වත්කමක් භාවිතා කිරීමේ අවසරයක් (ගිවිසුමට අදාළ දෙය හෝ වෙනත් වත්කමක්) ලෙස පැවතිය හැක.<br>• සාමාන්‍යයෙන් භාණ්ඩ ලැබුණු වහාම නිමි භාණ්ඩ ගිවිසුමෙහි මිල ගෙවනු ලැබේ.<br>• ගිවිසුම අදාළ දේවල් භාරදීම සංකේතීය අයිතිය (Constructive possession) හරහා සිදුවිය හැකිය. මෙම අවස්ථාවේදී, අදාළ දේවල් සම්බන්ධයෙන් ගනුදෙනුකරු සතු වගකීම අවසන් |

| | |
|---|---|
| | වන අතර, එතැන් පටන් අවසාන ගැනුම්කරුට ඒවා විකිණීම දක්වා බැංකුවේ වගකීම ආරම්භ වේ.<br><br>◦ භාණ්ඩ නැව්ගත කිරීමට අදාළ නැව්ගත කිරීමේ ලියකියවිලි ලැබීමෙන් පසු, පූර්ව නැව්ගත කිරීමේ Tijarah මූල්‍ය පහසුකම පශ්චාත් නැව්ගත කිරීමේ Tijarah මූල්‍ය පහසුකමක් බවට පරිවර්තනය වේ.<br><br>◦ නැව්ගත කරන ලද භාණ්ඩ තොගය ලැබුණු බව තහවුරු කිරීමෙන් අනතුරුව පශ්චාත් නැව්ගත කිරීමේ Tijarah මූල්‍ය පහසුකම Tijarah (Bank Risk Line) බවට පරිවර්තනය වේ.<br><br>◦ පූර්ව නැව්ගත කිරීමේ Tijarah මූල්‍ය පහසුකම පශ්චාත් නැව්ගත කිරීමේ Tijarah මූල්‍ය පහසුකමක් බවට පරිවර්තනය වීම මගින් ගනුදෙනුකරුවන්ට නැවත වරක් පූර්ව නැව්ගත කිරීමේ Tijarah මූල්‍ය පහසුකම ලබාගත හැකි වේ.<br><br>• මූල්‍ය පහසුකම Tijarah වෙතින් Bank Risk Line බවට පරිවර්තනය වීම මගින් ගනුදෙනුකරුවන්ට Tijarah සීමාවන් සම්බන්ධයෙන් පහසුවක් ලැබෙන අතර, එමගින් ඔවුන්ට නැවතත් මූල්‍ය පහසුකම් ලබාගත හැකි වේ. |
| අවශ්‍ය ලිපිලේඛන | • නිමි භාණ්ඩ ගිවිසුම<br>◦ ලිඛිත මිලගණන්<br>◦ භාණ්ඩ ලැබුණු බව තහවුරු කිරීමේ ලේඛනය [Goods Received Note (GRN)]<br>• නැව්ගත කිරීමේ නියෝජිතායතනය සමඟ ඇතිකරගත් ගිවිසුම<br>◦ නියෝජිතායතනයේ ගාස්තු<br>◦ මූල්‍ය පහසුකම් ගාස්තු |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ:<br>https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට |

| | |
|---|---|
| | පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |

## ISTISNA මූල්‍ය පහසුකම

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | Istisna යනු නිෂ්පාදනය කිරීමට හෝ ඉදිකිරීමට නියමිත නිශ්චිත භාණ්ඩ විකිණීම සඳහා වන ගිවිසුමක් වන අතර, ඒවා නිෂ්පාදනය කිරීමෙන් හෝ ඉදිකිරීමෙන් පසු පාරිභෝගිකයා වෙත ලබා දීමට නිෂ්පාදකයා හෝ ඉදිකිරීම්කරු (කොන්ත්‍රාත්කරු) බැඳී සිටී. |
| මූල්‍ය සම්පාදන ක්‍රම | • කාරක ප්‍රාග්ධනය - නිෂ්පාදන අවශ්‍යතා සඳහා<br>• වෙළඳ මූල්‍ය පහසුකම් - අපනයන සඳහා සහ අපනයනවලදී භාවිතා කරන බිල්පත් මිලදී ගැනීම්වලට ඉස්ලාමීය විකල්පයක් ලෙස<br>• දීර්ඝකාලීන මූල්‍ය පහසුකම් - ගොඩනැගිලි, යන්ත්‍රාගාර, කර්මාන්තශාලා සහ BOT (Build, Operate, Transfer) ව්‍යාපෘති සඳහා<br>• පාරිභෝගික නිවාස මූල්‍ය පහසුකම් - සුඛෝපභෝගී මහල් නිවාස ඉදිකිරීම සඳහා |
| සේවාවෙහි ස්වභාවය | Istisna ගිවිසුමක් සඳහා අවසර ලැබෙනුයේ ශ්‍රමයේ දායකත්වය සහිත නිෂ්පාදන හෝ ඉදිකිරීම් ක්‍රියාවලියක් මඟින් ඒවායේ ස්වාභාවික තත්ත්වය වෙනස් කළ හැකි අමුද්‍රව්‍ය සඳහා පමණි. ගිවිසුමට විෂය වන දෙය සෑම විටම නිෂ්පාදනය කළ යුතු දෙයකි.<br><br>• නිෂ්පාදනය කිරීමට නියමිත භාණ්ඩයේ වර්ගය, කාණ්ඩය, ගුණාත්මකභාවය සහ ප්‍රමාණය පිළිබඳ සියලු තොරතුරු නිෂ්පාදකයාට ලබා දී ඇත්නම් සහ ඉදිකිරීම්/නිෂ්පාදනය සඳහා අරමුදල්ද ලබා දී ඇත්නම්, නිෂ්පාදකයා වත්කම නිෂ්පාදනය කිරීමට බැඳී සිටින අතර ඒකපාර්ශ්විකව ගිවිසුම අවසන් කළ නොහැක.<br><br>• නිෂ්පාදන කටයුතු ආරම්භ වූ පසු Istisna ගිවිසුම යටතේ ඇති වගකීම ඉටු කිරීමට බැංකුව (Mustasnay) ද බැඳී සිටී.<br><br>• ගිවිසුම අවසානයේ Istisna ගිවිසුමක මිල දැනගැනීම අවශ්‍ය වේ. එය මුදල් හෝ ස්පර්ශ්‍ය භාණ්ඩ ආකාරයෙන් හෝ නිශ්චිත කාල සීමාවක් සඳහා වත්කමක [(විෂය කරුණ (BOT) හෝ වෙනත් වත්කමක්] ප්‍රයෝජනයක් ලෙස පැවතිය හැක. |

| | |
|---|---|
| | • Istisna ගිවිසුමක මිල කලින් හෝ කල් පසුවී හෝ යම් කාල සීමාවක් තුළ වාරික වශයෙන් හෝ ගෙවිය හැකිය. ගැනුම්කරුට අවශ්‍ය නම් මිල ගෙවීම වැඩ නිම කිරීමේ අදියර සමඟ සම්බන්ධ කළ හැකිය.<br><br>• භාරදීමේ දිනය සම්බන්ධයෙන් සිදුවන වෙනස්කම් අනුව Istisna ගනුදෙනුවල මිල වෙනස් විය හැක. භාරදීම ප්‍රමාද වුවහොත්, දිනකට නිශ්චිත ප්‍රමාණයකින් මිල අඩු කළ යුතු බවට පාර්ශ්වයන් අතර එකඟතාවයක් ඇතිකර ගැනීමට අවසර තිබේ.<br><br>• මුහුණ දීමට සිදුවන අවිනිශ්චිත තත්වයන් (පාලනය කළ නොහැකි) මත Istisna ගිවිසුමෙහි මිල වැඩි හෝ අඩු කිරීමට කිරීමට අවසර ඇත.<br><br>• අවසාන ගැනුම්කරු ගිවිසුමට අදාළ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ අරමුණින් නිෂ්පාදකයා සතුව ඇති ද්‍රව්‍යවල හිමිකරු ලෙස සැලකිය නොහැකිය.<br><br>• භාණ්ඩ භාරදෙන දිනය Istisna ගිවිසුමෙහි සඳහන් කිරීම අනිවාර්ය නොවේ. එහෙත් අවශ්‍ය නම් එවැනි දිනයක් සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන්ට එකඟතාවකට පැමිණිය හැක.<br><br>• අදාළ භාණ්ඩ භාරදීම සංකේතාත්මක අයිතිය (Constructive possession) යටතේ සිදු විය හැක. මෙම අවස්ථාවේදී අදාළ භාණ්ඩ සම්බන්ධයෙන් නිෂ්පාදකයාගේ වගකීම අවසන් වන අතර අවසාන ගැනුම්කරුගේ වගකීම ආරම්භ වේ.<br><br>• නිෂ්පාදිත වත්කම භාරදෙන අවස්ථාවේදී නොගැළපීමක් නිරීක්ෂණය වුවහොත් එය ගිවිසුම කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.<br><br>• කිසියම් දෝෂයක් අලුත්වැඩියා කිරීම හෝ අදාළ වත්කම නඩත්තු කිරීම සඳහා නිෂ්පාදකයා විසින් වගකියනු ලබන කාලසීමාවක් සඳහා එකඟ වීමට පාර්ශ්වයන්ට හැකියාව ඇත. |
| අවශ්‍ය ලිපිලේඛන | නිමිභාණ්ඩ පහසුකම් ගිවිසුම<br>-ලිඛිත මිලගණන්<br>-භාණ්ඩ ලැබුණු බව සහතික කිරීමේ ලේඛනය (GRN)<br><br>නිමි භාණ්ඩ නියෝජිතායතන ගිවිසුම<br>-නියෝජිතායතන ගාස්තුව<br>-මූල්‍ය පහසුකම් ගාස්තුව |

| | |
|---|---|
| | • ඇපකරය/වෙනත් පිළිගත් බැඳුම්කර<br><br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ: https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |

## අමානා බැංකුවේ වත්කම් මූල්‍ය පහසුකම් සහ කාරක ප්‍රාග්ධන මූල්‍ය පහසුකම්

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | අමානා බැංකුවේ වත්කම් මූල්‍ය පහසුකම් සහ කාරක ප්‍රාග්ධන මූල්‍ය පහසුකම් Diminishing Musharaka මූලධර්මය මත ක්‍රියාත්මක වේ.<br><br>Diminishing Musharaka යටතේ බැංකුව සහ ගනුදෙනුකරු එක්ව වත්කම (එනම් දේපළ/යන්ත්‍රෝපකරණ ආදිය) මිලදී ගන්නා අතර පසුව බැංකුව එහි කොටස ගනුදෙනුකරුට බදු දෙයි. කොටස් හිමිකම සම්පූර්ණයෙන්ම ඔහුට පැවරෙන තෙක් ක්‍රමයෙන් බැංකුවේ කොටස් කොටස මිලදී ගැනීමට ගනුදෙනුකරු පොරොන්දු වේ.<br><br>වත්කම් මූල්‍ය පහසුකම යටතේ අමානා බැංකුව විසින් ගනුදෙනුකරුට තම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමට මූල්‍යමය වශයෙන් පහසුකම් සැලසීම සඳහා සුදුසු වත්කමක ආයෝජනය කරනු ඇත. මේ සඳහා මාස 12 ක අනිවාර්ය රඳවා ගැනීමේ කාලයක් අදාළ වේ. එම කාලය තුළ ගනුදෙනුකරුට ප්‍රාග්ධන ඒකක මිලදී ගත නොහැකි අතර මාසික කුලියක් පමණක් ගෙවනු ඇත. මේ හේතුව නිසා අමානා බැංකුව සහ ගනුදෙනුකරු |

| | |
|---|---|
| | අතර වත්කමේ හිමිකාරීත්වය නොවෙනස්ව පවතී. |
| මූල්‍ය සම්පාදන ක්‍රම | **1. Diminishing Musharaka -** මෙය සාමාන්‍ය Diminishing Musharaka ගනුදෙනුවකි.<br><br>**2. කාරක ප්‍රාග්ධන Diminishing Musharaka -** සාමාන්‍ය Diminishing Musharaka මූල්‍ය පහසුකමක් වන මෙය යටතේ ගනුදෙනුකරුට සහන කාලයක් හිමි වේ.<br><br>**3. Diminishing Musharaka රථවාහන/යන්ත්‍රෝපකරණ මූල්‍ය පහසුකම් -** බද්ධ ක්‍රමයට රථවාහන හෝ යන්ත්‍රෝපකරණ මිලදීගන්නා විට මෙම මූල්‍ය පහසුකම් ක්‍රමවේදය භාවිතා කළ හැක. |
| සේවාවෙහි ස්වභාවය | • වත්කම ගනුදෙනුකරුගේ නමින් ලියාපදිංචි කෙරෙන අතර බැංකුවේ නමින් වත්කම වෙනුවෙන් සාධාරණ උකසක් නිර්මාණය කරනු ලැබේ.<br>• වත්කමෙහි හිමිකාරීත්වය ආරක්ෂා කිරීම සඳහා බැංකුව එය උකස් පදනම යටතේ ලබාගනී.<br>• Diminishing Musharaka ලබාගත හැක්කේ සමස්ත ව්‍යාපාරය සඳහා නොව, ස්පර්ශ්‍ය වත්කම් (නිශ්චිත වත්කම්) සඳහා පමණි.<br>• ආයෝජන කොටස්වල අනුපාතය ගිවිසුමෙහි පැහැදිලිව සඳහන් විය යුතුය. |
| අවශ්‍ය ලිපිලේඛන | • Diminishing Musharaka අයදුම්පත්‍රය<br>• Master Musharaka ගිවිසුම<br>• මූල්‍ය පහසුකම ලබාදීමේ සහ එය පිළිගැනීමේ ලිපිය<br>• බැංකුවේ පිළිගත් ඇපකර.<br><br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ:<br>https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු |

| | |
|---|---|
| | සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |

## MUSHARAKA මූල්‍ය පහසුකම්

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | Musharaka යනු ෂරියා මූලධර්මවලට අනුකූලව ව්‍යාපාර සහ වෙළඳ කටයුතු සිදු කිරීමේ පොදු අරමුණ වෙනුවෙන් හවුල්කරුවන් විවිධාකාර වූ දායකත්වයන්, රාජකාරි හෝ වගකීම් සහිතව ඇතිකරගනු ලබන හවුල්කාරීත්වයකි. Musharaka ගිවිසුමක් පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අතර ඇති විය හැක. මෙහිදී හවුල්කරුවන්/කොටස් හිමියන් ප්‍රාග්ධනයෙන් දායක වන අතර, කොටස් හිමියන් එකඟ වූ අනුපාතවලට අනුව ලාභය ඔවුන් අතර බෙදා දෙනු ලැබේ. |
| මූල්‍ය සම්පාදන ක්‍රම | **1. Local Musharaka -** ගනුදෙනුකරුවෙකුට අමානා බැංකුව විසින් තම සමස්ත ව්‍යාපාරයටම මුදල් යෙදවීමට අවශ්‍ය නම්, Local Musharaka පහසුකම භාවිතා කළ හැකිය.<br><br>**2. Transaction Musharaka -** මෙම ක්‍රමය භාවිතා කරනු ලබන්නේ සමාගමක නිශ්චිත ගනුදෙනුවක් සඳහා පමණි. |
| සේවාවෙහි ස්වභාවය | • Musharaka ගනුදෙනුව සඳහා බැංකුව සහ ගනුදෙනුකරු යන දෙපාර්ශ්වයම ප්‍රාග්ධන දායකත්වය ලබා දෙයි.<br>• ගිවිසුම ක්‍රියාත්මක කරන අවස්ථාවේදී ලාභ බෙදාගැනීමේ අනුපාතය සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණිය යුතුය.<br>• බැංකුව අක්‍රීය හවුල්කරු ලෙස කටයුතු කරන අතර ගනුදෙනුකරු ප්‍රධාන වශයෙන් හවුල්කාරීත්වයට අදාළ කටයුතු සිදු කරනු ඇත. බැංකුවේ නියෝජිතයෙකු විසින් ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරනු ලැබේ. ව්‍යාපාරයෙන් සිදුවන ඕනෑම ආකාරයක අව්‍යාජ |

| | |
|---|---|
| | අලාභයක්, ප්‍රාග්ධන දායකත්ව අනුපාතය අනුව බැංකුව සහ ගනුදෙනුකරු විසින් දරනු ලැබේ.<br>• ගනුදෙනුකරුගේ නොසැලකිල්ල නිසා යම් අලාභයක් සිදුවුවහොත්, ගනුදෙනුකරු එය සම්පූර්ණයෙන්ම දැරිය යුතුය.<br>• එක් එක් හවුල්කරු සඳහා ලාභ අනුපාතය තීරණය කළ යුත්තේ ව්‍යාපෘතිය/ව්‍යාපාරය විසින් උපයන ලද සැබෑ ලාභයට සමානුපාතිකව මිස ආයෝජනය කරන ලද ප්‍රාග්ධනයට සමානුපාතිකව නොවේ.<br>• සෑම හවුල්කරුවෙකුටම අනෙක් හවුල්කරුට නිසි පරිදි දැනුම් දීමෙන් අනතුරුව ඕනෑම අවස්ථාවක Musharaka අවලංගු කිරීමට අයිතියක් ඇති අතර, එමඟින් අදාළ Musharaka ගිවිසුම අවසන් වේ.<br>• එබඳු අවස්ථාවකදී, Musharaka වත්කම් පවතිනුයේ මුදල් ආකාරයෙන් නම්, ඒ සියල්ල හවුල්කරුවන් අතර සමානුපාතිකව බෙදා හරිනු ලැබේ. එහෙත් වත්කම් ඈවර කර නොමැති නම්, වත්කම් ඈවර කිරීම හෝ ඒවා බෙදා හැරීම හෝ හවුල්කරුවන් අතර බෙදා දීම සම්බන්ධයෙන් හවුල්කරුවන්ට එකඟතාවකට පැමිණිය හැක. |
| අවශ්‍ය ලිපිලේඛන | • Musharaka අයදුම්පත්‍රය<br>• Master Musharaka ගිවිසුම<br>• මූල්‍ය පහසුකම ලබාදීමේ සහ එය පිළිගැනීමේ ලිපිය<br>• බැංකුවේ පිළිගත් ඇපකර.<br><br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ: https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application- |

| | |
|---|---|
| | downloads/general-business-conditions.pdf |

## WAKALA මූල්‍ය පහසුකම

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | Wakala මූල්‍ය පහසුකමකදී ගනුදෙනුකරු ප්‍රතිලාභ අපේක්ෂාවෙන් යුතුව බැංකුවේ අරමුදල් කළමනාකරණය කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කරනු ඇත. |
| සේවාවෙහි ස්වභාවය | • ගනුදෙනුකරුට ඔහුගේ/ඇයගේ සේවාව සඳහා Wakala ගාස්තුවක් හිමි වේ .<br>• බැංකුවට තරගකාරී ලාභ අනුපාතයක් හිමි වනු ඇත. |
| අවශ්‍ය ලිපිලේඛන | • අයදුම්පත්‍රය<br>• ඉල්ලීම ඉදිරිපත් කිරීමේ ලිපිය<br>• Master Musharaka ගිවිසුම<br>• මූල්‍ය පහසුකම ලබාදීමේ සහ එය පිළිගැනීමේ ලිපිය<br>• සාමාන්‍ය ඇපකර.<br><br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ:<br>https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට |

| | |
|---|---|
| | පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |

# කල්බදු (ලීසිං)

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 සහ ඊට වැඩි, ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙකු වීම |
| මූලික ලක්ෂණ | බැංකුව විසින් ගනුදෙනුකරුට අවශ්‍ය වත්කම (වාහන, යන්ත්‍ර, උපකරණ ආදිය) මිලදී ගෙන එය ඔහුට කුලී පදනම මත ලබාදෙන අතර, කුලී කාලසීමාව අවසානයේදී ඔහුට එම වත්කම තෑගි දීමට ප්‍රතිඥා දෙයි. |
| සේවාවෙහි ස්වභාවය | සේවාවට අදාළ මූලධර්මය: Ijara<br>• වත්කමේ වටිනාකමෙන් 100%ක් දක්වා වසර 7ක් සඳහා මූල්‍ය පහසුකම් ලබාගත හැක.<br>• කුලිය ගෙවිය යුතු වන්නේ වත්කම භාවිතය ආරම්භ කිරීමෙන් පසුවය.<br>• වත්කම ක්‍රියාකාරී තත්ත්වයේ තිබේ නම් පමණක් කුලිය අය කෙරේ. |
| අවශ්‍ය ලිපිලේඛන | • පුද්ගලයන් සඳහා නම් ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය<br>• අයදුම්පත<br>• කල්බදු (ලීසිං) ගිවිසුම<br>• Takaful ආවරණය<br>• ව්‍යාපාර සඳහා නම් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය<br>• පසුගිය මාස 06 ක බැංකු ගිණුම් ප්‍රකාශ (අදාළ නම්) |

| | |
|---|---|
| | • පසුගිය වසර 3 ක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ බදු වාර්තා (අදාළ නම්)<br>• ප්‍රෝෆෝමා ඉන්වොයිසිය/ සැපයුම්කරු හෝ නියෝජිතයා විසින් වත්කම සඳහා ලබාදෙන ලද මිල ප්‍රකාශය/ තක්සේරු වාර්තාව<br>• දැනට ලබන වැටුප තහවුරු කරන සාක්ෂි (වැටුප් පත්‍රය) හෝ වෙනත් ආදායම් තහවුරු කිරීමේ සාක්ෂි<br>• මූල්‍ය පහසුකම ලබාදීමේ සහ එය පිළිගැනීමේ ලිපිය<br><br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ: https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |
| ප්‍රතිචාර සහ පැමිණිලි | ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත.<br><br>පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756<br>ඊමේල් : info@amana.lk \| feedback@amana.lk<br><br>ඔබගේ විමසීම් අපගේ වෙබ් අඩවිය හරහා යොමුකරන්න: www.amanabank.lk<br><br>කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මඟින් අප වෙත දැනුම් දෙන්න:<br>කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ<br>අමානා බැංකුව අංක 485, ගාලු පාර, කොළඹ 03<br>ඊමේල්: servicequality@amana.lk |

| | |
|---|---|
| | |
| | ඉහත සඳහන් ක්‍රම මඟින් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම්, ඔබට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවාව ලබාගත හැක.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පහත දැක්වේ.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන්,<br>අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 04<br><br>දුරකථන: + 94 11 2595624 ෆැක්ස්: +94 11 2595625<br>වෙබ් අඩවිය: www.financialombudsman.lk |